දුරකථන ) 011 2669192 , 011 2675011
தொலைபேசி ) 011 2698507 , 011 2694033
Telephone ) 011 2675449 , 011 2675280

ෆැක්ස් ) 011 2693866
பெக்ஸ் ) 011 2693869
Fax ) 011 2692913

විද්‍යුත් තැපෑල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

මගේ අංකය )
எனது இல ) MA/MS/ B/09/2019
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2019.07. 06
Date )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

# සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதார, போசணை மற்றும் சுதேச வைத்திய அமைச்சு
# Ministry of Health, Nutrition & Indigenous Medicine

සියළුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
සියළුම පළාත්/ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියළුම ශික්ෂණ/පළාත්/දිස්ත්‍රික් මහ රෝහල්හි අධ්‍යක්ෂවරුන්,
සියළුම මූලික රෝහල්වල වෛද්‍ය අධිකාරිවරුන්,
සියළුම දිස්ත්‍රික්/ප්‍රාදේශීය රෝහල්වල දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරිවරුන්,
රේඛීය අමාත්‍යාංශය යටතේ පවතින සියළුම ආයතන හා ව්‍යාපාරවල අධ්‍යක්ෂවරුන්,
අදාල සියළුම ශ්‍රේණිධාරි වෛද්‍ය නිලධාරීන්,

**ශ්‍රේණිධාරි වෛද්‍ය නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම**

ශ්‍රේණිධාරි වෛද්‍ය නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු නියෝගයන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙහි නිර්දේශයන් අනුව ප්‍රකාශයට පත්කරනු ලබන බැවින්, අංක 1589/30 හා 2009-02-20 දින දරණ අති විශේෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ **XVIII** වන පරිච්ඡේදයේ දැක්වෙන නිර්දේශ අනුව කටයුතු කිරීමට සියළුම ආයතන ප්‍රධානීන් හා වෛද්‍ය නිලධාරීන් බැඳී සිටින බවට මෙයින් දන්වා සිටිමි.

02. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිදි අදාල සියළුම වෛද්‍ය නිලධාරීන් ඔවුන් ස්ථාන මාරු ලබා ඇති නියමිත ආයතනයන්වල නියමිත ඒකකයන් වෙත අනුයුක්ත කිරීමේ කටයුතු සිදුකරනු ලැබිය යුතුය. **නිශ්චිත තනතුරක් නොමැතිව වෛද්‍ය නිලධාරි ලෙසින් ස්ථාන මාරු කරනු ලබන්නන් හැර නිශ්චිත තනතුරක් හෝ ඒකකයක් වෙත ස්ථාන මාරු කරනු ලබන වෛද්‍ය නිලධාරීන් අනිවාර්යයෙන්ම නියමිත ඒකකයන් හෝ තනතුරුවලට පත්කරනු ලැබිය යුතු වේ.**

03. නමුත් බොහෝමයක් අවස්ථාවන්වල ස්ථාන මාරු ලබා පැමිණෙන නවක වෛද්‍ය නිලධාරීන් අනුයුක්ත කරනු ලැබීමේදී ස්ථාන මාරු නියෝගයන්වලට අවනත නොවී, ඔවුන් වෙනත් ඒකකයන් වෙත අනුයුක්ත කර තිබීම නිරීක්ෂණය කරනු ලැබ ඇති අතර, එම හේතුවෙන් වාර්ෂික ස්ථාන මාරු චක්‍රයන් ක්‍රියාත්මක කිරීමේදී ගැටළුදායක තත්වයන් මතුවන අවස්ථාවන්ද දක්නට ඇත.

04. එහෙයින් ස්ථාන මාරු ජාලයන් සක්‍රිය ලෙසින් ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි ස්ථාන මාරු ලබන ශ්‍රේණි වෛද්‍ය නිලධාරීන් ඔවුන් ස්ථාන මාරු ලබන නියමිත ඒකකයන්වල නිශ්චිත තනතුරු වෙතම පමණක් අනුයුක්ත කිරීමට කටයුතු කරන මෙන් සියළුම ආයතන ප්‍රධානීන්ට මෙයින් දැනුම් දෙනු ලැබේ. එසේ කටයුතු නොකරන අවස්ථාවන් හේතුවෙන් යම් ගැටළුවක් ඇති වන්නේ නම් ඒ පිළිබඳවූ සම්පූර්ණ වගකීම ආයතන ප්‍රධානීන් විසින් භාරගත යුතු වේ.

05. තවදුරටත් ඉහත නියෝගයන් අනුව කටයුතු නොකරන්නේ නම් මෙම වාර්ෂික ස්ථාන මාරු ජාලයන් අඩපණ කිරීමට කටයුතු කළා සේ සළකා අදාල ආයතන ප්‍රධානීන්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බවද වැඩිදුරටත් කණගාටුවෙන් දන්වා සිටිමි.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත - ලේකම්, සෞඛ්‍ය සේවා කමිටුව, රා. සේ. කොමිෂන් සභාව - කරු. දැනගැනීම හා අවශ්‍ය කටයුතු පිණිස.